2020

# සබරගමුව පළාත් උපාධිධාරී සමීක්ෂණය



තොරතුරු, පර්යේෂණ හා විශේෂ ව්‍යාපෘති අංශය

නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන)

කාර්යාලය

සබරගමුව පළාත් සභාව

සබරගමුව පළාත් උපාධිධාරී සමීක්ෂණය 2020

# සාරාංශ වාර්තාව

## 1. හැඳින්වීම

### 1.1 සබරගමුව පළාත

ලංකාවේ පිහිටි පළාත් අතරින් සබරගමුව පළාත විශාලත්වය අතින් 8වන ස්ථානය එහි විශාලත්වය ව.කි.මී 4968 කි.

සබරගමුව පළාත රත්නපුර සහ කෑගල්ල යන ප්‍රධාන පරිපාලන දිස්ත්‍රික්කයන්ගෙන් සමන්විත වේ. එය පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 28ක්, ග්‍රාම නිලධාරී කොට්ඨාස 1148ක් සහ ගම්මාන 3683කට බෙදේ.


2012 ජන හා නිවාස සංගණන වාර්තාවට අනුව සබරගමුව පළාතේ සමස්ත ජනගහනය 1,928,655ක් වන අතර, එය රත්නපුර සහ කෑගල්ල දිස්ත්‍රික්ක අතරේ 1,088,007ක් සහ 840,648ක් වශයෙන් බෙදී ගිය අතර, 2018 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු ඇස්තමේන්තුගත ජනගහනය පිළිවෙළින් 1,163,000 හා 884,000කි. පළාත සඳහා එම අගය 2,047,000කි.

සබරගමුව පළාත පසුගිය වසර කීපය තුළ අධ්‍යාපන අංශයේ වඩාත් ඉහළ ප්‍රගතියක් අත්කරගෙන ඇත. සිංහල පාසැල් 923ක් හා දෙමළ මාධ්‍ය පාසැල් 206ක් ලෙස පාසැල් 1129කි. 2018 සංඛ්‍යා ලේඛණ අනුව ශිෂ්‍ය සංඛ්‍යාව 394,048ක් වන අතර ගුරු සංඛ්‍යාව 21,604කි

ආසන්න වර්ෂ කීපය තුළ ජාතික මට්ටමේ ප්‍රතිඵල විශ්ලේෂණය අනුව 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වය, අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග වලින් දිවයිනේ පළාත් අතරින් මුල් ස්ථාන හතර තුල පැවතීමට හැකියාව ලැබී ඇත.

### 1.2 සබරගමුව පළාත පිහිටීම

සිතියම 01: සබරගමුව පළාත් සිතියම




### 1.3 සබරගමුව පළාතේ විශ්වවිද්‍යාල ප්‍රවේශය

සබරගමුව පළාතේ අ.පො.ස. (උ.පෙ.) සමත්ව විශ්වවිද්‍යාල සුදුසුකම් ලබන සංඛ්‍යාව 2014 - 2018 වසර වල 16,000 - 20,000ත් අතර ප්‍රමාණයක් වී ඇත. ඉන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලබන සංඛ්‍යාව සමගාමී අධ්‍යයන වර්ෂ 3ක දී පහත පරිදි වී ඇත.

වගුව 01: සබරගමුව පළාත විශ්වවිද්‍යාල ප්‍රවේශය

| විෂය ධාරාව හා අධ්‍යයන වර්ෂ | 2015/2016 | 2016/2017 | 2017/2018 |
|---|---|---|---|
| කලා | 749 | 908 | 958 |
| කළමණාකරණය හා වානිජ්‍යය | 506 | 531 | 536 |
| නීති | 36 | 36 | 34 |
| විද්‍යාව | 453 | 529 | 420 |
| වෛද්‍ය විද්‍යාව | 102 | 122 | 126 |
| පශු වෛද්‍ය විද්‍යාව | 5 | 5 | 5 |
| දන්ත වෛද්‍ය විද්‍යාව | 5 | 5 | 5 |
| කෘෂිකර්ම | 140 | 140 | 153 |

| | | | |
|---|---|---|---|
| ඉංජිනේරු විද්‍යාව | 129 | 137 | 142 |
| වාස්තු විද්‍යා / ප්‍රමාණ සමීක්ෂණ | 27 | 21 | 34 |
| පරිගණක විද්‍යාව | 116 | 120 | 113 |
| වෙනත් | 306 | 333 | 340 |
| එකතුව | 2574 | 2887 | 2866 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, ආර්ථික හා සමාජ සංඛ්‍යාන සමීක්ෂණය 2018*

වගුව 02: රත්නපුර දිස්ත්‍රික්කය විශ්වවිද්‍යාල ප්‍රවේශය

| විෂය ධාරාව හා අධ්‍යයන වර්ෂ | 2015/2016 | 2016/2017 | 2017/2018 |
|---|---|---|---|
| කළා | 378 | 504 | 563 |
| කළමණාකරණය හා වානිජ්‍යය | 319 | 326 | 318 |
| නීති | 22 | 21 | 23 |
| විද්‍යාව | 262 | 315 | 242 |
| වෛද්‍ය විද්‍යාව | 62 | 86 | 77 |
| පශු වෛද්‍ය විද්‍යාව | 3 | 3 | 3 |
| දන්ත වෛද්‍ය විද්‍යාව | 3 | 3 | 3 |
| කෘෂිකර්ම | 71 | 83 | 93 |
| ඉංජිනේරු විද්‍යාව | 79 | 83 | 89 |
| වාස්තු විද්‍යා / ප්‍රමාණ සමීක්ෂණ | 13 | 8 | 18 |
| පරිගණක විද්‍යාව | 64 | 75 | 70 |
| වෙනත් | 189 | 212 | 221 |
| එකතුව | 1465 | 1719 | 1720 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, ආර්ථික හා සමාජ සංඛ්‍යාන සමීක්ෂණය 2018*

වගුව 03: කෑගල්ල දිස්ත්‍රික්කය විශ්වවිද්‍යාල ප්‍රවේශය

| විෂය ධාරාව හා අධ්‍යයන වර්ෂ | 2015/2016 | 2016/2017 | 2017/2018 |
|---|---|---|---|
| කළා | 371 | 404 | 395 |
| කළමණාකරණය හා වානිජ්‍යය | 187 | 205 | 218 |
| නීති | 14 | 15 | 11 |
| විද්‍යාව | 191 | 214 | 178 |
| වෛද්‍ය විද්‍යාව | 40 | 36 | 49 |
| පශු වෛද්‍ය විද්‍යාව | 2 | 2 | 2 |
| දන්ත වෛද්‍ය විද්‍යාව | 2 | 2 | 2 |
| කෘෂිකර්ම | 69 | 57 | 57 |
| ඉංජිනේරු විද්‍යාව | 50 | 54 | 53 |
| වාස්තු විද්‍යා / ප්‍රමාණ සමීක්ෂණ | 14 | 13 | 16 |
| පරිගණක විද්‍යාව | 52 | 45 | 43 |
| වෙනත් | 117 | 121 | 119 |
| එකතුව | 1109 | 1168 | 1143 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, ආර්ථික හා සමාජ සංඛ්‍යාන සමීක්ෂණය 2018*

## 1.4 සබරගමුව පළාත් උපාධිධාරී සමීක්ෂණය

සබරගමුව පළාත තුලින් වාර්ෂිකව උසස් අධ්‍යාපනය අවසන් කරන කණ්ඩායම හඳුනා ගැනීමේ වැඩසටහන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය මගින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ යටතේ උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් ලෙස කාණ්ඩ දෙකක් යටතේ සමීක්ෂණය සිදුකරණු ලබයි.

වාර්ෂිකව සිදු කෙරෙන උපාධිධාරීන් සමීක්ෂනය සඳහා රජයේ රැකියාවක් අපේක්ෂා කරන හා රජයේ හෝ පෞද්ලික අංශයේ ඌන සේවාවන් හි නිරත උපාධිධාරීන් බහුතරයක් යොමුවේ.

මෙම පිරිස වාර්ෂයකට 1500-2000 පමණ වන අතර වාර්ෂිකව පළාතේ බිහිවන උපාධිධාරීන් සංඛ්‍යාවෙන් 70%-80% පමණ වනු ඇත.

මෙම සංක්ෂිප්ත වාර්තාව මගින් 2020 වර්ෂයේ සිදුකරණ ලද උපාධිධාරී ලියාපදිංචි කිරීම 1566 කට අදාල තොරතුරු විශ්ලේෂණාත්මකව ඉදිරිපත් කර ඇත.

සමගාමී පෙර වර්ෂයන්ට සාපේක්ෂව මෙම වසරේ සමීක්ෂණය සඳහා යොමු වූ උපාධිධාරී සංඛ්‍යාවේ කැපී පෙනෙන අඩුවීමක් දැකිය හැකි අතර, එය වර්ෂය තුල පැවති Covid 19 අවදානම් තත්වය හමුවේ පැවති සංචරණ සීමාවන්හි බලපෑමක් විය හැකිය.

කෙසේ වෙතත් අන්තර්ජාලය ඔස්සේ මාර්ගගතව සිදුකිරීමේ හා අයදුම්පත්‍ර පළාත් සභාවේ නිළ වෙබ් අඩවිවල එලකිරීම වැනි පහසුකම් සලසා දී තිබිණි.

ඒ අනුව සබරගමුව පළාතේ සමීක්ෂණය සඳහා යොමුවූ උපාධිධාරීන් 1566 ක නියැදියකින් සිදු කරන ලද සමීක්ෂණයේ ප්‍රතිඵල වල නිගමනයන් පහත පරිදි දැක්විය හැකිය.


## 2. දත්ත ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය

### 2.1 සමීක්ෂණය සඳහා යොමුවූ උපාධිධාරී සංඛ්‍යාව.

පළාත් සභාව වෙත පැමිණ හා අන්තර්ජාලයේ එලකල ආකෘතිය මගින් සමීක්ෂණ තොරතුරු ලබාදුන් සංඛ්‍යාව 1566කි.

### 2.2 සබරගමුව පළාත තුළ සමස්ත උපාධිධාරී නියෝජනය

වගුව 04: සබරගමුව පළාත තුළ සමස්ත උපාධිධාරී නියෝජනය




සමීක්ෂණ සඳහා තොරතුරු ලබාදුන් සංඛ්‍යාව අතරින් උපාධිධාරීන් 857ක සංඛ්‍යාවක් (55%) රත්නපුර දිස්ත්‍රික්කය තුළත්, උපාධිධාරීන් 709 ක සංඛ්‍යාවක් (45%) කෑගල්ල දිස්ත්‍රික්කය තුළත් නියෝජනය කරයි.

### 2.3 පිරිමි හා ගැහැණු අනුව

වගුව 05 : සබරගමුව පළාත තුළ උපාධිධාරී ගැහැණු හා පිරිමි දිස්ත්‍රික්කය අනුව නියෝජනය.

| | රත්නපුර | කෑගල්ල | පළාත | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| පිරිමි | 152 | 114 | 266 | 17% |
| ගැහැණු | 705 | 595 | 1300 | 83% |
| එකතුව | 857 | 709 | 1566 | 100% |

ප්‍රස්ථාරය 1: සබරගමුව පළාත තුළ උපාධිධාරී ගැහැණු හා පිරිමි දිස්ත්‍රික්කය අනුව නියෝජනය.




සබරගමුව පළාත තුල උපාධිධාරීන් 1566 ක් යොදාගෙන කරන ලද ඉහත සමීක්ෂණයට අනුව පළාත තුළ කාන්තා හා පිරිමි නියෝජනය අනුව කාන්තාවන් 83% ක විශාල ප්‍රතිශතයක්ද, ඊට සාපේක්ෂව පිරිමින් 17% ක් වන කුඩා ප්‍රතිශතයක්ද පෙන්නුම් කරයි.

### 2.4 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනුව

වගුව 06 : රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනුව උපාධිධාරී නියෝජනය

| ප්‍රා.ලේ. කොට්ඨාශය | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| අයගම | 09 | 1.05 |
| බලංගොඩ | 93 | 10.85 |
| ඇහැලියගොඩ | 45 | 5.25 |
| ඇලපාත | 30 | 3.50 |
| ඇඹිලිපිටිය | 76 | 8.87 |
| ගොඩකවෙල | 55 | 6.42 |
| ඉඹුල්පෙ | 61 | 7.12 |
| කහවත්ත | 23 | 2.68 |
| කලවාන | 41 | 4.78 |
| කිරිඇල්ල | 29 | 3.38 |
| කොලොන්න | 30 | 3.50 |
| කුරුවිට | 73 | 8.52 |
| නිවිතිගල | 46 | 5.37 |
| ඕපනායක | 22 | 2.57 |
| පැල්මඩුල්ල | 65 | 7.58 |
| රත්නපුර | 133 | 15.52 |
| වැලිගෙපොල | 26 | 3.03 |
| එකතුව | 857 | 100% |

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ගත් කළ සබරගමුව පළාතේ රත්නපුර දිස්ත්‍රික්කය තුළ වැඩිම ප්‍රතිශතයක් පෙන්නුම් කරන්නේ රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (15.5%) වන අතර මීළඟට වැඩිම අගය

බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (10.85%) පෙන්නුම් කරයි. නමුත් මෙහි අනිකුත් සියළුම ප්‍රා. ලේ කොට්ඨාශ 10% ට වඩා අඩු අගයක් ගනියි. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතරින් අඩුම අගය අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (1.05%) පෙන්නුම් කරයි.

වගුව 07 : කෑගල්ලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය අනුව උපාධිධාරී නියෝජනය

| ප්‍රා.ලේ. කොට්ඨාශය | සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| අරණායක | 72 | 10.16 |
| බුලත්කොහුපිටිය | 25 | 3.53 |
| දෙහිඕවිට | 30 | 4.23 |
| දැරණියගල | 26 | 3.67 |
| ගලිගමුව | 77 | 10.86 |
| කෑගල්ල | 112 | 15.80 |
| මාවනැල්ල | 109 | 15.37 |
| රඹුක්කන | 83 | 11.71 |
| රුවන්වැල්ල | 41 | 5.78 |
| වරකපොල | 106 | 14.95 |
| යටියන්තොට | 28 | 3.95 |
| එකතුව | 709 | 100% |

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ගත් කළ සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කය තුළ වැඩිම ප්‍රතිශතයක් පෙන්නුම් කරන්නේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (15.80%) වන අතර මීළඟට වැඩිම අගය මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (15.37%) පෙන්නුම් කරයි. එමෙන්ම, මෙහි වරකාපොල (14.95%), රඹුක්කන(11.71%),ගලිගමුව(10.86%),අරණායක(10.16%) යන ප්‍රා. ලේ කොට්ඨාශ 10% ට වඩා වැඩි අගයක් ගනියි. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අතරින් අඩුම අගය බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (3.53%) පෙන්නුම් කරයි.

## 2.5 උපාධිය ලබාගත් විෂය ධාරාව අනුව

වගුව 08 : උපාධිය ලබාගත් විෂය ධාරාව අනුව උපාධිධාරී නියෝජනය

| විෂය ධාරාව | රත්නපුර | කෑගල්ල | පළාත |
|---|---|---|---|
| කලා | 559 | 484 | 1043 |
| වාස්තු විද්‍යා / ප්‍රමාණ සමීක්ෂණ | 00 | 03 | 03 |
| වානිජ | 35 | 21 | 56 |
| කළමණාකරණ | 129 | 91 | 220 |
| විද්‍යා | 85 | 80 | 165 |
| ඉංජිනේරු | 03 | 01 | 04 |
| නීති | 03 | 02 | 05 |
| වෛද්‍ය | 00 | 00 | 00 |
| ඖෂධවේදී | 00 | 00 | 00 |
| ආයුර්වේද | 00 | 00 | 00 |
| කෘෂි | 03 | 13 | 16 |
| ගණිත | 01 | 00 | 01 |
| තාක්ෂණ | 39 | 14 | 53 |
| රංග කලා | 00 | 00 | 00 |
| එකතුව | 857 | 709 | 1566 |

උපාධිය ලබා ගත් විෂය ධාරාව අනුව සලකා බලන විට කලා විෂය ධාරාව තුළින් සමස්ථයෙන් අඩකට වඩා වැඩි අගයක් වන (67%) ක් පමණ පෙන්නුම් කරයි. කලමනාකරණ විෂය ධාරාව තුළින් (14%), විද්‍යා විෂය ධාරාව තුළින් (11%) ක් ද පෙන්නුම් කරන අතර අනිකුත් සියළුම විෂය ධාරාවන්ට වෙන්වී ඇති ප්‍රතිශතය වන්නේ 8% ක් වැනි කුඩා ප්‍රතිශතයක් වීම විශේෂත්වයකි.

## 2.6 උපාධි හදාරන ලද භාෂා මාධ්‍යය අනුව

වගුව 09 : උපාධි හදාරන ලද භාෂා මාධ්‍යය අනුව උපාධිධාරී නියෝජනය

| | රත්නපුර | කෑගල්ල | පළාත |
|---|---|---|---|
| සිංහල | 521 | 421 | 942 |
| ඉංග්‍රීසි | 323 | 239 | 562 |
| දෙමළ | 10 | 41 | 51 |
| සිංහල/ ඉංග්‍රීසි | 03 | 03 | 06 |
| සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ | 00 | 01 | 01 |
| වෙනත්(චීන/ හින්දි/ ජපන්) | 00 | 04 | 04 |
| එකතුව | 857 | 709 | 1566 |

ඉහත සමීක්ෂණයට අනුව උපාධිය හදාරණ ලද භාෂා මාධ්‍යය අනුව සබරගමුව පළාත තුළ සිංහල භාෂාව භාෂා මාධ්‍ය ලෙස යොදා ගැනීමට වැඩි ප්‍රවණතාවයක් දක්වා ඇත. එහි ප්‍රතිශතය වන්නේ (60%) කි. එමෙන්ම, ඉංග්‍රීසි මාධ්‍ය (36%), දෙමළ මාධ්‍ය (3.3%) ක් හා අනිකුත් මාධ්‍යයන් සඳහා (0.7%) ක් ද වෙන් වී ඇත.

## 2.7 උපාධිය සඳහා වූ පංති සාමාර්ථය අනුව

වගුව 10 : උපාධිය සඳහා වූ පංති සාමාර්ථය අනුව උපාධිධාරී නියෝජනය

| | රත්නපුර | කෑගල්ල | පළාත |
|---|---|---|---|
| පළමු පෙළ | 31 | 25 | 56 |
| දෙවන පෙළ (ඉහළ) | 230 | 231 | 461 |
| දෙවන පෙළ (පහළ) | 168 | 108 | 276 |
| සාමාන්‍ය | 428 | 345 | 773 |
| එකතුව | 857 | 709 | 1566 |

ඉහත සමීක්ෂණයට අනුව උපාධිය සඳහා වූ පංති සාමාර්ථය අනුව සබරගමුව පළාත තුළ සාමාන්‍යය සාමාර්ථයක් ලබා ගැනීමට වැඩි ප්‍රවණතාවයක් දක්වා ඇත. එහි අගය 49.37% ක් වේ. එමෙන්ම. දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් ලැබීම 29.43% ක් ද, දෙවන පෙළ පහළ සාමාර්ථයක් ලැබීම 17.63% ක් ද, පළමු පෙළ සාමාර්ථයක් ලැබීම 3.57% ක් ද වන බව මෙමගින් පෙන්නුම් කරයි.

## 2.8 උපාධිය සම්පූරණ කරන ලද වර්ෂය අනුව

වගුව 11 : උපාධිය සම්පූරණ කරන ලද වර්ෂය අනුව උපාධිධාරී නියෝජනය

| වර්ෂය | රත්නපුර ( %) | කෑගල්ල (%) | එකතුව (%) |
|---|---|---|---|
| 2020 | 36.05 | 32.91 | 34.62 |
| 2019 | 42.20 | 40.96 | 41.63 |
| 2018 | 10.52 | 11.58 | 11 |
| 2017 | 4.85 | 7.06 | 5.86 |
| 2016 | 2.01 | 3.81 | 2.83 |
| 2015 | 0.95 | 1.13 | 1.03 |
| 2014 | 1.42 | 1.13 | 1.29 |
| 2013 | 0.47 | 0.56 | 0.51 |
| 2012 | 0.24 | 0.14 | 0.19 |
| 2011 | 0.59 | 0.14 | 0.39 |
| 2010 | 0.47 | 0.28 | 0.39 |
| 2009 | 0.24 | 0.14 | 0.19 |
| 2008 | 0.00 | 0.00 | 0.00 |
| 2007 | 0.00 | 0.00 | 0.00 |
| 2006 | 0.00 | 0.00 | 0.00 |
| 2005 | 0.00 | 0.14 | 0.06 |
| එකතුව | 100% | 100% | 100% |

මෙම සමීක්ෂණයට අනුව සබරගමුව පළාත තුළ උපාධිධාරීන්, උපාධිය සම්පූරණ කරන ලද වර්ෂය 2019 වීම 41.63% ක් ද වර්ෂය 2020 වීම 34.62% ක් ද වේ. එමෙන්ම 2018 දී 11% ක් ද වන අතර අනිකුත් සියළුම වර්ෂ වලදී 10% ට වඩා අඩු ප්‍රතිශතයක් ගනියි.

## 2.9 උපාධිය සම්පූරණ කරන ලද විශ්ව විද්‍යාලය අනුව

වගුව 12: උපාධිය සම්පූරණ කරන ලද විශ්ව විද්‍යාලය අනුව උපාධිධාරී නියෝජනය

| | රත්නපුර | කෑගල්ල | පළාත |
|---|---|---|---|
| රාජ්‍ය විශ්වවිද්‍යාල | 841 | 699 | 1540 |
| පෞද්ගලික විශ්ව විද්‍යාල | 9 | 2 | 11 |
| විදේශීය විශ්ව විද්‍යාල | 7 | 8 | 15 |
| එකතුව | 857 | 709 | 1566 |

මෙම සමීක්ෂණයට අනුව සබරගමුව පළාත තුළ උපාධිධාරීන්, උපාධිය සම්පූරණ කරන ලද ලද විශ්ව විද්‍යාලය අනුව රාජ්‍ය විශ්ව විද්‍යාලයකින් උපාධිය සම්පූරණ කිරීම 98.33% වැනි විශාල අගයක් පෙන්නුම් කළද, පෞද්ගලික විශ්ව විද්‍යාලයකින් හා විදේශීය විශ්ව විද්‍යාලයකින් උපාධිය සම්පූරණ කිරීම 0.72% හා 0.95% වැනි කුඩා අගයන් පෙන්නුම් කරයි.


## 2.10 උපාධියේ විශේෂීතාවය අනුව

වගුව 13 : උපාධියේ විශේෂීතාවය අනුව උපාධිධාරී නියෝජනය

| | රත්නපුර | කෑගල්ල | පළාත |
|---|---|---|---|
| විශේෂවේදී උපාධිය | 479 | 360 | 839 |
| සාමාන්‍ය උපාධිය | 378 | 349 | 727 |
| එකතුව | 857 | 709 | 1566 |

ඉහත සමීක්ෂණයට අනුව සබරගමුව පළාත තුළ උපාධිධාරීන් විශේෂවේදී උපාධියක් හැදෑරිම 53.57% ද සාමාන්‍යය උපාධියක් හැදෑරිම 46.43% ක් ලෙස දැක්විය හැකිය.

### 2.11 උපාධියේ මාධ්‍ය හා උපාධියට ලබා ගන්නා ලද සාමාර්ථය අනුව පළාතේ උපාධිධාරී නියෝජනය




උපාධියේ මාධ්‍ය හා උපාධියට ලබා ගන්නා ලද සාමාර්ථය අනුව පළාතේ උපාධිධාරී නියෝජනය ඉහත ආකාරයට දැක්විය හැකිය. මෙහිදී සිංහල මාධ්‍යයෙන් උපාධිය හැදෑරූ අයගෙන් වැඩි පිරිසක් (54.25%) ක් සාමාන්‍ය සාමාර්ථ ලබා ගැනීමට සමත් වීඇත. ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය හැදෑරූ අයගෙන් වැඩි පිරිසක් ද (44.48%) ක් සාමාන්‍ය සාමාර්ථ ලබා ගැනීමට සමත් වීඇත. 49.02% ක් පමණ දෙමළ මාධ්‍ය දෙවන පෙළ සාමාර්ථ ලබා ගැනීමට සමත් වී ඇත.

## 3. නිගමනය

සබරගමුව පළාත් සභාව වෙත පැමිණ හා අන්තර්ජාලයේ එලකල ආකෘතිය මඟින් සබරගමුව පළාත් උපාධිධාරීන් 1566 කින් ලබා ගන්නා තොරතුරු මගින් පහත නිගමනයන්ට එළඹිය හැකිය.

1. වෘත්තීයමය හා වෘත්තීයමය නොවන ලෙස ප්‍රධාන වශයෙන් හඳුනාගත් කාණ්ඩ දෙකක් යටතේ උපාධි පිරිනැමෙන අතර ඉන් වෘත්තීයමය නොවන කාණ්ඩය යටතේ උපාධිය ලබාගන්නා පිරිස සමීක්ෂණය සඳහා යොමුවීම නිරීක්ෂනය වේ.
2. සමීක්ෂණ තොරතුරු ලබාදුන් සංඛ්‍යාව අතරින් වැඩි ප්‍රතිශතයක් රත්නපුර දිස්ත්‍රික්කය තුළින්ද (55%) අඩු ප්‍රතිශතයක් කෑගල්ල දිස්ත්‍රික්කය තුළින්ද (45%) න් ද නිරූපණය කරයි.
3. සබරගමුව පළාත තුළ උපාධිධාරී පිරිමි හා ගැහැණු නියෝජනය ගත් කළ පිරිමි පාර්ශවය මෙන් ආසන්නව පස් ගුණයක් ස්ත්‍රී පාර්ශවය නියෝජනය කරයි. (1:5 ආසන්නව ලෙස දැක්විය හැකිය.)
4. එහිදී කෑගල්ල සහ රත්නපුර යන දිස්ත්‍රික්ක දෙක තුළම මෙම තත්වය දක්නට ලැබේ.
5. රත්නපුර දිස්ත්‍රික්කය තුළ උපාධිධාරීන්ගේ, රත්නපුර සහ බලංගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළින් වැඩි නියෝජනයක්ද අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළින් අඩු නියෝජනයක්ද පෙන්නුම් කරන අතර කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කෑගල්ල, මාවනැල්ල, වරකාපොළ, රඹුක්කන, ගලිගමුව, අරණායක යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළින් වැඩි නියෝජනයක්ද බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළින් අඩු නියෝජනයක්ද පෙන්නුම් කරයි.
6. උපාධිය ලබා ගත් විෂය ධාරාව සලකා බලන විට කලා විශය ධාරාව තුළින් සමස්ථයෙන් අඩකට වඩා වැඩි ප්‍රමාණයක් උපාධිය ලබා ගෙන ඇති අතර එය පළාතෙන් මෙන්ම රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්ක වෙන වෙනම සසඳන විටද වෙනසක් වී නොමැත. මීට අමතරව කළමණාකරණ හා වානිජ විශය ධාරාව කෙරෙහි වැඩි නැඹුරුවක්ද දක්නට ලැබේ.
7. සමීක්ෂණයට අනුව උපාධිය හදාරණ ලද භාෂා මාධ්‍යය අනුව සබරගමුව පළාත තුළ සිංහල භාෂාව භාෂා මාධ්‍ය ලෙස යොදා ගැනීමට වැඩි ප්‍රවණතාවයක් දක්නට ඇති අතර, එය සමස්ථයෙන් 65% ක් පමණ වේ. ඉංග්‍රීසි මාධ්‍ය සඳහා ආසන්නව සමස්ථයෙන් 35% ක් පමණද, හා අනිකුත් මාධ්‍යයන් සඳහා සමස්ථයෙන් ඉතා අඩු ප්‍රමාණයක් වෙන් වී ඇත.
8. උපාධිය සඳහා වූ පංති සාමාර්ථය අනුව සබරගමුව පළාත තුළ සාමාන්‍යය සාමාර්ථයක් ලබා ගැනීමට ඉදිරිපත් වූ සංඛ්‍යාවෙන් අඩකට පමණ හැකිවී තිබේ. පළමු පෙළ සාමාර්ථයක් ලැබීමේ හැකියාව 3.57% ක් ද වැනි කුඩා ප්‍රතිශතයක් ද වේ.
9. සබරගමුව පළාත තුළ උපාධිධාරීන්, උපාධිය සම්පූර්ණ කරන ලද ලද විශ්ව විද්‍යාලය අනුව රාජ්‍ය විශ්ව විද්‍යාලයකින් උපාධිය සම්පූර්ණ කිරීම 90%ක් වැනි ඉහළ අගයක් පෙන්නුම් කරයි. පෞද්ගලික විශ්ව විද්‍යාල වලින් සහ විදේශීය විශ්ව විද්‍යාල වලින් උපාධිය ලබා ගන්නේ 10%ක් වැනි ඉතා අඩු පිරිසක්ය. එමෙන්ම, විශේෂවේදී උපාධියක් හැදෑරීම

53.57% ද සාමාන්‍යය උපාධියක් හැදෑරිම 46.43% ක් ලෙස දැක්විය හැකිය.

10. ඉංග්‍රීසි මාධ්‍යයෙන් උපාධිය හදාරණ උපාධිධාරීන්ගෙන් වැඩි පිරිසක් විශේෂවේදි උපාධියක්ද සිංහල මාධ්‍යයෙන් උපාධිය හදාරණ උපාධිධාරීන්ගෙන් වැඩි පිරිසක් සාමාන්‍යය උපාධියක්ද ලබන බවට තොරතුරු මත පදනම්ව තීරණය කළ හැකිය.

***